www.wsws.org ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# මෙක්සිකානු චිත්‍ර ශිල්පී දියේගෝ රිවේරා ගැන ලියොන් ට්‍රොට්ස්කි (1938)

**Leon Trotsky on Mexican painter Diego Rivera (1938)**

## 2011 දෙසැම්බර් 21

1938 ජූනි මස පල වූ “අපේ යුගය තුල කලාව හා දේශපාලනය” නමැති ලිපියෙහි ලියොන් ට්‍රොට්ස්කි එවක හතරවැනි ජාත්‍යන්තරය සමග දේශපාලන සහමතියකින් පසු වූ මෙක්සිකානු චිත්‍ර ශිල්පී හා බිතුසිතුවම්කරු දියේගෝ රිවේරාගේ කෘති සාකච්ඡාවට ලක් කලේ ය.

1930 ගනන්වල ස්ටැලින්වාදී තන්ත්‍රය විසින් සෝවියට් සංගමය තුල ස්ථාපිත කරනු ලැබූ කලාත්මක ජීවිතය පිලිබඳ “වධ කඳවුරක්” හැටියට තමන් නාම ගැන්වූ තත්වය ට්‍රොට්ස්කි පලමුකොට විභාග කලේ ය.

ට්‍රොට්ස්කි වැඩිදුරටත් මෙසේ ලිවී යඃ

“වර්තමාන නිල සෝවියට් චිත්‍ර කලාවේ ශෛලිය ‘සමාජවාදී යථාර්ථවාදය’ වසයෙන් හැඳින්වේ. පැහැදිලිව ම මේ නාමය මත් නිපදවනු ලැබ ඇත්තේ කලා දෙපාර්තමේන්තුවේ කිසියම් ඉහල බලධරයකු විසිනි. මේ ‘යථාර්ථවාදය’ සමන්විත වන්නේ පසුගිය සියවසේ තෙවැනි කාර්තුවට අයත් පලාත්බද ඩගැරියොටයිප් (daguerreotypes) සේයාරූ කලාවේ අනුකරනයකිනිඃ පෙනී යන පරිදි ‘සමාජවාදී’ ලක්ෂනය සමන්විත වනුයේ කිසි විටෙක හට නොගත් සිදුවීම් ව්‍යාජක ඡායාරූප ශිල්පයේ පන්නයට නිරූපනය කිරීමෙනි. සන්ත්‍රාසය සමග මුසු වුනු කායික පිලිකුලෙන් තොර ව, මෝසර රයිෆල්වලින් සන්නද්ධ බලධරයන්ගේ සුපරීක්ෂාව යටතේ පෑන්, පින්සල් හා කතුරුවලින් සන්නද්ධ ව සිටින බලධරයන් ‘ශ්‍රේෂ්ඨ’, හා ‘දීප්තිමත්’ නායකයින් උත්කර්ෂයට නංවනු දැක්වෙන, සැබැවින් ම සුධීමත්භාවයේ හෝ ශ්‍රේෂ්ඨත්වයේ බින්දු මාත්‍රයක් වත් නොමැති සෝවියට් පද්‍ය සහ ගද්‍ය කියැවීමට හෝ සිතුවම් හා මූර්තිවල ප්‍රතිනිෂ්පාදන නැරඹීමට හෝ නොහැකි ය. ස්ටැලින්වාදී යුගය තුල කලාව නිර්ධන පන්තික විප්ලවයේ ප්‍රගාඪ පරිහානියෙහි ඍජු ම ප්‍රකාශනය ලෙසින් පවතිනු ඇත.

“කෙසේ වතුදු මේ තත්වය සෝවියට් සමූහාන්ඩු සංගමයේ දේශ සීමා තුලට කොටු ව පවතින්නක් නො වේ. ඔක්තෝබර් විප්ලවයට පමා වී පිදෙන පිලිගැනීමක වේශයෙන් බටහිර බුද්ධිජීවීන්ගේ ‘වාමාංශය’ සෝවියට් නිලධරය අබියස දනින් වැටී ඇත. රීතියක් වසයෙන්, කිසියම් චරිත ශක්තියකින් හා දක්ෂතාවකින් යුතු කලාකරුවෝ දුරට වී සිටියහ. එහෙත් පලමු පේලියේ පෙනී සිටීමට අවස්ථාව ලද වැඩබැරිදාසලා, වෘත්තීය අභිවෘද්ධිය පතන්නන්, හා නිකමුන් පිලිබඳ තත්වය එක සේ අභාග්‍යසම්පන්න ය. ස්ත්‍රී පුරුෂ දෙවර්ගයෙහි ම ලේකම්වරුන්, ප්‍රන්ස ලේඛක රොමැයිං රොලොන්ද්ගේ අනිවාර්ය ලිපි, සහනාධාර මත මුද්‍රාපිත සංස්කරන, කලාව හා ජීපීයූව (ස්ටැලින්වාදී රහස් පොලිසිය) අතර බෙදුම් රේඛාව පාදාගැනීම අපහසු භෝජන සංග්‍රහ හා සම්මේලන, ආදියෙන් සමන්විත නා නා ප්‍රකාර මධ්‍යස්ථාන හා කමිටු පිලිබඳ කුලප්පුවක් හටගෙන තිබේ. පුලුල් පරිමාන ව පැතිරුනු ක්‍රියාකාරකම් තිබිය දීත් එහි කර්තෘගේ හෝ ක්‍රෙම්ලිනයේ සිට ඊට අනුප්‍රානය සපයන්නන්ගේ ජීවිත කාලය ඉක්මවා පැවතීමට සමත් එක ද කෘතියක් හෝ නිපදවීමට මේ මිලිටරීකෘත ව්‍යාපාරය සමත් ව නැත.

“චිත්‍ර කලා ක්ෂේත්‍රය තුල ඔක්තෝබර් විප්ලවය සිය ශ්‍රේෂ්ඨතම අර්ථකථකයා සොයාගෙන ඇත්තේ සෝවියට් සංගමය තුලින් නො වේ, දුර ඈත පිහිටි මෙක්සිකෝවෙනි. නිල ‘මිතුරන්’ අතරින් නො ව, හතරවැනි ජාත්‍යන්තරය සිය සේනාවන් සරසා ගැනීමට අභිමානවත් වන ඊනියා ‘ජන හතුරකුගේ’ ස්වරූපයෙනි. සියලූ ජනතාවන්ගේත් සියලූ යුගවලත් කලාත්මක සංස්කෘතීන්ගෙන් පෝෂනය ලද රිවේරා සිය සුධීමත්භාවයේ ගම්භීරතම තන්තුවලින් මෙක්සිකානුවකු ලෙස වාසය කර තිබේ. එහෙත් මේ උදාර බිතුසිතුවම් තුල ඔහුට ආවේශය සැපයුවේ, කලා සම්ප්‍රදායට ඉහලින්, එක්තරා ආකාරයකට සමකාලීන කලාවට ඉහලින්, තමාට මත් ඉහලින් ඔහුව ඔසවා තැබුවේ, නිර්ධන පන්ති විප්ලවයේ දැවැන්ත පිපිරුම යි. ඔක්තෝබරයෙන් තොර ව වැඩ, පීඩනය හා නැගිටීම පිලිබඳ වීරාඛ්‍යානය නිර්මානාත්මක ව විනිවිදීමෙහිලා ඔහු සතු බලය මේ සා පෘථුල ගාම්භීර්යයක් සාක්ෂාත් කරගනු නැත. සමාජ විප්ලවයෙහි සැඟවුනු උල්පත් දැකගැනීමට ඔබ කැමැත්තෙහි ද? විප්ලවවාදී කලාව කෙබඳු දැයි දැකගැනීමට ඔබ රිසි ද? එසේ නම් රිවේරාගේ බිතුසිතුවම් දෙස බලන්න.

“තවත් මඳක් ලං ව බැලුවොත් ඔබ වැන්ඩලූන් - කතෝලිකයන් සහ සත්තකින් ම ස්ටැලින්වාදීන් ද ඇතුලු අවශේෂ ප්‍රතිගාමීන් - සිදු කල තුවාල සහ කැලැල් පැහැදිලි ව දකිනු ඇත. මේ කැපුම් හා තුවාල බිතුසිතුවම්වලට වඩාත් උදාර වූ ජීවයක් පිඹින්නේ ය.

ඔබ අබියස ඇත්තේ හුදු 'චිත්‍රයක්' නො ව, නිෂ්ක්‍රීය සෞන්දර්ය ධ්‍යානනයක් සඳහා ආරම්මනයක් නො ව, පන්ති අරගලයෙහි ජීවමාන කොටසකි. ඒ සමග ම එය අග්‍ර කලා කෘතියක් ද වෙයි.

"මෙක්සිකානු මහජන ගොඩනැගිලිවල බිත්ති මත රිවේරාගේ පින්සල් පහර උපයෝගී කරගැන්මට අවකාශ සලසා ඇත්තේ තව මත් ජාතික ස්වාධීනත්වය පිලිබඳ අරගලයේ වේදිකාවෙන් මතු ව නො ආ ඓතිහාසික යෞවනයේ පවතින රටකි. එක්සත් ජනපදය තුල එය වඩා දුෂ්කර විය. මධ්‍ය කාලීන යුගවල පූජකයින්, අවිද්‍යාව නිසා, පෞරානික සාහිත්යික නිෂ්පාදිතයන් හම්පත් මතින් මකා ඒවා සිය පන්ඩිතමානී ප්‍රලාපවලින් වසා දැමුවේ යම් සේ ද, එසේ ම රොක්ෆෙලර්වරුන්ගේ බැලයෝ, මෙවර ද්වේෂසහගත ව, ප්‍රතිභාසම්පන්න මෙක්සිකානුවාගේ බිතුසිතුවම් සිය සාලංකාර තුච්ඡත්වයෙන් වසා දැමූහ. මේ මෑත කාලීන පුනර්ලිඛිත පිටපත (palimpsest හෙවත් අලුතින් ලියනු පිනිස කොටස් මකන ලද ලේඛනය) ජරපත් වෙමින් පවතින ධනේශ්වර සමාජයක් තුල හායනයට පත් කලාවේ ඉරනම අනාගත පරම්පරාවන්ට තීරනාත්මක ව පෙන්නුම් කරනු ඇත.

"කෙසේ වුව ද ඔක්තෝබර් විප්ලවයේ රාජ්‍යය තුල තත්වයත් මීට වඩා යහපත් නැත. බැලූ බැල්මට ඇදහිය නොහැකි පුදුමයක් වුව ද විප්ලවය මතින් උපන් නිලධරය තමා ම වෙනුවෙන් උදාරම් මාලිගා සහ ස්මාරක ඉදිකරමින් සිටින මොස්කව්වල හෝ ලෙනින්ග්‍රෑඩ්වල හෝ සෝවියට් සමූහාන්ඩු සංගමයේ අන් තැනක හෝ දියේගෝ රිවේරාගේ කලාවට ඉඩක් නැත. 'නායකයා' නිරූපනය කෙරෙන සුරුවම් වත් (ස්ටැලින්වාදී නිලධර ක්ලිමන්ට්) වොරොෂිලොව්ගේ අශ්වයාගේ ජීව ප්‍රමානයේ ආලේඛ වත් සිතුවම් නොකරන සිත්තරෙකු ක්‍රෙම්ලිනය කෙසේ නම් ඉවසා වදාරන්න ද? රිවේරාට සෝවියට් දොරටු වැසීම මගින් ඒකාධිපති ආඥාදායකත්වය මත වචනයට නැගිය නොහැකි පරිමානයේ අපකීර්තියක් සදාකාලිකව හංවඩු ගසනු ඇත."

© www.wsws.org